# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1864/62 - 2014 මැයි මස 30 වැනි සිකුරාදා - 2014.05.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/22/08/2009

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.12.02 වැනි දිනැති හා අංක 1682/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අම්පාර, දමන, ගල්කන්ද හි පදිංචි ජී. ගුණදාස මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපාය හි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.04.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/22/08/2009

කාර්මික අධිකරණයේ දී ය.

ජී. ගුණදාස මයා,
ගල්කන්ද,
දමන,
අම්පාර.

*පළමු පාර්ශවය*

නඩු අංකය : ඒ-3364 සහ

මාර්ග සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2010.11.19 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

මෙම නඩුවේ ඉල්ලුම්කරු මුල සිටම නඩුව පවත්වා ගෙන යෑම සඳහා නිසි උද්‍යෝගයක් දක්වා නැත.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වගඋත්තරකාර පක්ෂයේ නියෝජිතයින් කීප වතාවක්ම පැමිණ ඉල්ලුම්කරු නොමැති බැවින් නඩු විභාග කටයුත්ත පවත්වාගෙන යාමට නොහැකිව ආපසු ගොස් ඇත.

එසේ වුවද, ඉල්ලුම්කරුගේ යහපත උදෙසා නැවත ඉල්ලීමක් කර නඩුව ආරම්භ කිරීමට අවස්ථාව ලබා දී තිබුණ ද, ඉල්ලුම්කරු ඒ සඳහා උනන්දුවක් දක්වා නොමැත.

ඒ නිසා ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමින් තීන්දුවක් ඇතුළත් කරමි.

එම්. ආරිෆ්,
බේරුම්කරු

2014.04.30.

06 - 457

---

මගේ අංකය : IR/15/50/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.10.04 වැනි දිනැති හා අංක 1726/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.09.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, අංක 712A (නව ලිපිනය - දෙහිවල, නැදිමාල, කඩවත පාර, 71 ඒ) හි පදිංචි ඒ. ඩී. ප්‍රේමරත්න මයා ඇතුළු සේවකයින් 06 දෙනෙකු හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ, ලේක් හවුස්, තැ.පෙ. 248 හි පිහිටි සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.11.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/50/2010.

කාර්මික අධිකරණයේ දී ය

01. කේ. ඩී. හේමකීර්ති,
123/2, ගිහාන් පාර,
කොස්වත්ත,
තලංගම උතුර.

02. ඩබ්. ගලබඩ,
33 බී, අස්ගිරිය,
ගම්පහ.

නඩු අංකය : ඒ/3406

03. ඒ. ඩී. ප්‍රේමරත්න,
712 ඒ, කඩවත පාර,
නැදිමාල,
දෙහිවල.

04. එල්. පී. පෙරේරා,
832/2, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

05. එස්. ඒ. එස්. සුරවීර,
112, වාතලුවාව උතුර,
වාතලුවාව,
ගම්පහ.

*පළමු පාර්ශවය*

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
තැ. පෙ. 248, ලේක් හවුස්,
කොළඹ.

- එදිරිව -

*දෙවන පාර්ශවය*

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2011.09.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් කම්කරු කොමසාරිස්තුමාගේ 2011.09.08 වැනි දින දරන යොමුවෙන් දක්වා සිටින්නේ :-

"එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2004.08.30 වැනි දිනැති BP 174 - 09/04 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ යටතේ හිමිකම් පහත නම් සඳහන් සේවකයින් හට හිමි වන්නේ ද ? එසේ හිමි වන්නේ නම් ඒ මොනවා ද ? කොපමණ ප්‍රමාණයකින් ද යන්න පිළිබඳව වේ.

01. ඒ. ඩී. ප්‍රේමරත්න මහතා
02. කේ. ඩී. හේමකීර්ති මහතා
03. එස්. ඒ. එස්. සුරවීර මහතා
04. ඩබ්. ගලබඩ මහතා
05. එල්. පී. පෙරේරා මහතා
06. එච්. කේ. ඩී. තිලකරත්න මහතා"

ඉහත සඳහන් ආරවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව විස්තරය 2011.10.26 වැනි දිනට පෙර එවන ලෙසට ඉල්ලා සිට ඇති නමුත්, එකී විස්තරය නියමිත දිනට ලැබී නොමැත. ඉල්ලුම්කරුවන් විසින් ඒ සඳහා තවත් සති 02 ක කාලයක් ඉල්ලා 2011.10.31 වැනි දින ලිපියකින් යොමු කර ඇත.

එයින් අනතුරුව 2011.11.21 වැනි දින ඉහත සඳහන් ඉල්ලුම්කරුවන් 06 දෙනා විසින් ඉදිරිපත් කරන බවට සඳහන් ආරවුල පිළිබඳ විස්තරය ඉදිරිපත් කර ඇති නමුත්, එහි ඒ. ඩී. ප්‍රේමරත්න මහතා හැර සෙසු 05 දෙනා අත්සන් තබා ඇත.

කම්කරු කොමසාරිස්ගේ 2011.09.23 වැනි දින දරන යොමුවට අනුව 2011.12.07 වැනි දින ආරවුල පිළිබඳව පරීක්ෂණය ආරම්භ කරන ලදී. මෙදින එස්. ඒ. එස්. සුරවීර මහතා සහ එච්. කේ. ඩී. තිලකරත්න මහතා මිය ගොස් සිටින බව ඉල්ලුම්කාර පාර්ශවය විසින් දන්වා සිටින ලදී. වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා 2012.01.16 වැනි දින දක්වා කල් දෙන ලදී. වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශය ඉදිරිපත් නොවූයෙන් 2012.02.02 වැනි දින ඉල්ලුම්කාර පාර්ශවයේ ද කැමැත්ත මත 2012.02.17 වැනි දින දක්වා වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කල් ලබා දෙන ලදී.

2012.03.29 වැනි දින නැවත පරීක්ෂණයට ගත් අවස්ථාවේදී මිය ගිය එච්. කේ. ඩී. තිලකරත්න මහතා සහ එස්. ඒ. එස්. සුරවීර මහතා වෙනුවෙන් පාර්ශවකරුවන් ආදේශ කිරීමට අවශ්‍ය බැවින් ඉල්ලුම්කාර පාර්ශවය විසින් වැඩිදුර දිනයක් ඉල්ලා සිටින ලදී. එකී ලේඛනද ඉදිරිපත්වීමෙන් පසු තම ප්‍රකාශය ඉදිරිපත් කරන බව වගඋත්තරකාර පාර්ශවය විසින් දන්වා සිටින ලදී.

කෙසේ වෙතත් මෙම ආරවුල පිළිබඳව වගඋත්තරකාර ආයතනයේ ඉහළ නිලධාරීන් සමග සමථයක් ඇති කර ගන්නා ලෙසට ඉල්ලුම්කාර පාර්ශවයට උපදෙස් දෙන ලදී.

නැවත 2012.04.25 වැනි දින පැවැත්වූ පරීක්ෂණයේදී මිය ගිය එස්. ඒ. එස්. සුරවීර මහතා සහ එච්. කේ. ඩී. තිලකරත්න මහතා වෙනුවෙන් පාර්ශවකරුවන් ආදේශ කිරීම සඳහා වැඩිදුරටත් දිනයක් ඉල්ලා සිටින ලදී.

මෙම ආරවුල සඳහා ඉල්ලුම් කර ඇති ඉල්ලුම් පත්‍රය හා අනෙකුත් ලේඛන සලකා බලා ඉල්ලුම්පත්‍රයේ පවත්නා විධි නීතතාවය සැලකිල්ලට ගෙන එකී ලේඛන සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම්කාර පාර්ශවයෙන් ඉදිරිපත් කරන ලද ලේඛන ආපසු භාර දෙන ලදී.

තවද මෙම ආරවුල සමථය කර ගැනීම සඳහා ඉල්ලුම්කාර පාර්ශවය විසින් ලිඛිතව ඉල්ලා සිටින ලෙසට ඉදිරිපත් වූ කරුණු සලකා බලා ඒ සඳහා ඉල්ලුම්කාර පාර්ශවයට පහසු වන පරිදි ඉදිරි දිනයක් ලබා දෙන ලදී. ඉහත සඳහන් පරිදි කල් තබන ලද පරීක්ෂණය 2012.05.23 වැනි දින නැවත පරීක්ෂණයට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශවය විසින් ඉහත කී විභාගය ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ආදේශ කිරීමක් අවශ්‍ය වන බවත්, ඒ අනුව මෙම නඩුව එදිනම විභාගයට ගත යුතු බවත්, කියා සිටින ලදී. ඒ අනුව ඉදිරි දිනයේදී සමථයක් හෝ ඉදිරිපත් වී ඇති ලේඛන මත විභාගය පැවැත්වීමට තීරණය කරන ලදී.

ඉහත කී තීරණයට අනුව 2012.06.18 වැනි දින නැවත පරීක්ෂණය ආරම්භ කළ අවස්ථාවේදී මිය ගිය එච්. කේ. ඩී. තිලකරත්න මහතා වෙනුවෙන් ඔහුගේ භාර්යාව වන රූපසිංහ ආරච්චිගේ අයිරින් පෙරේරා, පුතා වන හල්ජෝති සේනක තිලකරත්න, දුව වන අනූෂා තිලකරත්න, පුතා වන හල්ජෝති රවීන්ද්‍ර තිලකරත්න යන අය උරුමකරුවන් ලෙස ඉදිරිපත් කර ඒ සියළු දෙනා වෙනුවෙන් මෙම නඩුවේ කාර්ය කටයුතු සඳහා ඔහුගේ පුතා වන හල්ජෝති සේනක තිලකරත්න යන අය පත් කරන ලෙස ඉල්ලා සිටි අතර, මිය ගිය එස්. ඒ. එස්. සුරවීර මහතා වෙනුවෙන් ඔහුගේ භාර්යාව වන හල්කැටිදානෙලාගේ වයලට් රූපා ශ්‍රියාලතා පත් කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

මෙකී ලේඛන මත නඩු විභාගය පැවැත්වීම පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය විරෝධතා ඉදිරිපත් කරන ලදී. වගඋත්තරකාර පාර්ශවයට මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය ඉදිරි දිනයේදී ඉදිරිපත් කළ හැකි බවට දන්වා සිටින ලදී.

අද දින වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා අසනීපයෙන් සිටින බැවින් වෙනත් දිනයක් ඉල්ලා සිටි බැවින්, ඒ කරුණ පිළිබඳව සැලකිල්ලට ගෙන නඩු විභාගය සඳහා ඉදිරි දිනයක් ලබා දෙන ලදී.

නැවත 2012.09.19 වැනි දින නඩු විභාගය ආරම්භ කරන ලදී. එදින කම්කරු කොමසාරිස්තුමාගේ IR/15/50/2010 සහ 2011.09.08 වැනි දින දරන යොමුවට අනුව බේරුම්කරණයට විෂය වී ඇති කරුණු පහදා විස්තර කර දෙන ලදී.

එයින් අනතුරුව ඉහත කී මිය ගිය ඉල්ලුම්කරුවන් දෙදෙනා වන එස්. ඒ. එස්. සුරවීර සහ එච්. කේ. ඩී. තිලකරත්න වෙනුවෙන් පාර්ශවකරුවන් ආදේශ කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කරන ලදී.

තවද, වගඋත්තරකාර පාර්ශවය 2012.03.29 වැනි දින දරන තම පළමු ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. වැඩිදුරටත් තම විරෝධතාවය ඉදිරිපත් කරමින් වගඋත්තරකාර පාර්ශවය කියා සිටින්නේ ඉල්ලුම්කාර පාර්ශවයෙන් ඉදිරිපත් කර ඇති ලේඛනවලට අනුව එස්. ඒ. එස්. සුරවීර මහතා 2009.07.24 වැනි දින මිය ගොස් ඇති බවත්, එනමුත් මෙම බේරුම්කරණය සඳහා යොමු කිරීම සිදු කර ඇත්තේ එයින් පසුව වන 2011.09.23 වැනි දින බවත්, එබැවින් ඔවුන් දෙදෙනාගේ නම් මෙම බේරුම්කරණයට සම්බන්ධ කර ගැනීම දෝෂ සහගත වන බවත් ය.

එයට පිළිතුරු ප්‍රකාශයක් කරමින් ඉල්ලුම්කාර පාර්ශවය විසින් කියා සිටියේ මෙම බේරුම්කරණයට විෂය කරුණු වූ 01 සිට 06 දක්වා වූ සේවක මහතුන්ගේ ඉල්ලීම 2005 වර්ෂයේ ඉදිරිපත් කරන ලද්දක් බවයි.

කෙසේ වෙතත් වගඋත්තරකරුගේ 2012.03.20 වැනි දින දරන විරෝධතාවයට ප්‍රතිඋත්තරය සහ වැඩිදුර ලිඛිත දේශන ද සමග ඉදිරිපත් කිරීමට සති 02 ක කාලයක් ඉල්ලා සිටි අතර, ඒ ඉල්ලීමට ඉඩ දෙන ලදී.

එයින් පසු ලිඛිත දේශන හා පිළිතුරු සඳහා 2012.10.17 වැනි දින සහ 2012.11.14 වැනි දින ලබා දීමෙන් අනතුරුව මේ බේරුම්කරණය පිළිබඳ පරීක්ෂණය 2013.01.24 වැනි දින අවසන් කරමින් තීන්දුවක් ඇතුළත් කරන ලදී.

එයින් අනතුරුව පාර්ශවකරුවන්ට ලිඛිත දේශන සහ පිළිතුරු සඳහා 2012.10.17 වැනි දින සහ 2012.11.14 වැනි දින ආදී වශයෙන් දිනයන් ලබා දීමෙන් පසු අවසන් වශයෙන් 2013.01.24 වැනි දින මෙම පරීක්ෂණය පිළිබඳ කරුණු සැලකිල්ලට ගන්නා ලදී.

ඉහත සඳහන් පරිදි කම්කරු කොමසාරිස්තුමාගේ 2011.09.23 වැනි දින යොමුවට අදාළව 2011.12.07 වැනි දින ආරම්භ වූ මෙම බේරුම්කරණය පිළිබඳ පරීක්ෂණ ක්‍රියාවලියේදී 2012.03.29 වැනි දින ඉල්ලුම්කාර පාර්ශවය විසින් මෙම ඉල්ලීම ඉදිරිපත් කරන ලද ඉල්ලුම්කරුවන් 06 දෙනාගෙන් දෙදෙනෙකු වන එච්. කේ. ඩී. තිලකරත්න සහ එස්. ඒ. එස්. සුරවීර යන ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු මිය ගොස් ඇති බවට පළමුවරට පරීක්ෂණ සභාව වෙත දැනුම් දෙන ලදී. එයින් අනතුරුව එකී මිය ගිය ඉල්ලුම්කරුවන් දෙදෙනා වෙනුවෙන් ආදේශ කිරීමක් සඳහා ලේඛන 2012.04.25 වැනි දින ඉදිරිපත් කළ අවස්ථාවේදී කම්කරු කොමසාරිස්තුමාගේ 2011.09.08 වැනි දින දරන යොමුව ඉල්ලුම්කාර පාර්ශවය විසින් 2011.11.21 වැනි දින ඉදිරිපත් කර ඇති ආරවුල පිළිබඳ ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ විස්තර ප්‍රකාශය සහ ඉහත කී එච්.කේ. ඩී. තිලකරත්න සහ එස්. ඒ. එස්. සුරවීර යන අයගේ මරණ සහතික සහ අනෙකුත් අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමේදී එකී ඉල්ලුම්කරුවන් දෙදෙනා කම්කරු කොමසාරිස්තුමාගේ යොමුවට පෙරම මිය ගොස් ඇති බව ඉල්ලුම්කරුවන්ගේ ඉහත කී ප්‍රකාශය ඉල්ලුම්කරුවන් දෙදෙනා වෙනුවට වෙනත් පුද්ගලයින් විසින් අත්සන් කර ඇති බවත්, එකී ලේඛනයේ ඒ ඉල්ලුම්කරුවන් වෙනුවෙන් නියෝජිත තත්ත්වයෙන් ඉදිරිපත් කරන බවට කිසිදු ප්‍රකාශනයක් හෝ බලය පැවරීමක් හෝ කර නොමැති බැවින් එකී ලේඛනය බැලූ බැල්මට දෝෂ සහගත වන බවටත්, ඒ තිදෙනාට මේ පරීක්ෂණය වැඩිදුරටත් පවත්වාගෙන යැමට නොහැකි බවක් පෙනෙන්නට තිබුණි. මේ හේතුවෙන් එකී ලේඛන සංශෝධනය කර ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම්කාර පාර්ශවය විසින් කරන ලද ඉල්ලීමට අනුව ඒ සඳහා දිනයක් ලබා දෙන ලදී.

මේ කාරණය සඳහා ඉහත සඳහන් පරිදි දින කීපයක් ලබා දී තිබුණ ද, ඉල්ලුම්කාර පාර්ශවය විසින් මෙම මූලික අවශ්‍යතාවය වන ලේඛන සංශෝධන කරමින් විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම වැඩිදුරටත් පැහැර හරින ලදී.

මේ තත්ත්වය යටතේ ඉහත කී පරීක්ෂණය පවත්වා ගෙන යා නොහැකි බැවින් ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි.

නීතිඥ එම්. ආරිෆ්,
බේරුම්කරු.

2013.11.21

06-458